රෙජිස්ට්‍රාර්/අධ්‍යක්ෂ ජනරාල්:
பணிப்பாளர் நாயகம் பதிவாளர் இல
Director Genaral/Registrar
011-2864483

අධ්‍යක්ෂ
பணிப்பாளர்
Director
011-2888424

සහකාර අධ්‍යක්ෂ
உதவி பணிப்பாளர்
Asst. Director
011-2884612

කාර්යාලය
அலுவலகம்
Office
011 -2877376

ෆැක්ස් :
தொலை நகல
Fax
011-2884612


(3)

මගේ අංකය
எனது இல
My No.
VSSO/NGO/VISA In./Circular

ඔබේ අංකය
உமது இல
Your No.

දිනය
திகதி
Date
2023.04. 17


මහජන ආරක්ෂක අමාත්‍යාංශය
பொதுமக்கள் பாதுகாப்பு அமைச்சு
**Ministry of Public Security**

**රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය - 15 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.**
அரச சார்பற்ற நிறுவனங்களின் தேசிய செயலகம் – 15ஆம்மாடி சுஹுருபாய பத்தரமுல்ல.
**National Secretariat for Non-governmental Organizations - 15th Floor, Suhurupaya, Battaramulla.**

විද්‍යුත් තැපැල් மின் அஞ்சல் E-mail:ngosecretariat.gov@gmail.com


සියළුම ලියාපදිංචි රාජ්‍ය නොවන සංවිධාන ප්‍රධානීන් වෙත.

<u>රාජ්‍ය නොවන සංවිධානවල සේවයට පැමිණෙන විදේශිකයින් සඳහා වීසා නිර්දේශ ලබා දීම.</u>

**රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය මගින් වීසා නිර්දේශ ලබා දෙනු ලබන්නේ මෙම කාර්යාලයේ ලියාපදිංචි රාජ්‍ය නොවන සංවිධාන සඳහාම පමණි. එසේම ඇතැම් ව්‍යාපාරික වීසා වර්ග (Business Visa) මෙන්ම සංචාරක වීසා ( Tourist Visa) මගින් රාජ්‍ය නොවන සංවිධාන වෙත පැමිණෙන විදේශිකයින්ගේ වීසා දීර්ඝ කිරීම සඳහා නිර්දේශ ලබාදීම මෙම කාර්යාලය විසින් සිදු නොකරනු ඇත.**

රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි රාජ්‍ය නොවන සංවිධාන වෙත වීසා නිර්දේශ ලබාදීමේ යාවත්කාලීන කරන ලද ක්‍රමවේදය පහත පරිදි වේ.

**1)** වීසා වර්ග:

I. පැමිණීමේ වීසා (Entry Visa)

**a.** කෙටි කාලීන ප්‍රවේශ වීසා (Short visit)

මාසයකට අඩු කාලයක් සඳහා මෙම වීසා නිර්දේශ ලබා දෙනු ඇත.

**b.** ප්‍රවේශ වීසා (Entry Visa / Prior Visa)

මෙරටට පැමිණීමේ දින සිට මාසයක කාලයක් සඳහා වීසා නිර්දේශ ලබා දෙනු ඇත.

II. වාස වීසා ( Residence Visa)

ප්‍රවේශ වීසා අවසන් වීමෙන් පසුව අවුරුද්දක කාල සීමාවක් සඳහා මෙම වීසා නිර්දේශය ලබා දෙනු ඇත.

**02.** වීසා ඉල්ලීම් සහ අවශ්‍ය ලේඛණ අදාළ දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිළධාරී මගින් මෙම ලේකම් කාර්යාලය වෙත යොමු කළ යුතුය.

**03.** වීසා නිර්දේශ ලබා දීමේදී සංවිධානයේ ප්‍රගති වාර්තා, ක්‍රියාකාරී සැළැස්ම, යාවත්කාලීන කරන ලද සංවිධානයේ තොරතුරු ඇතුළත් වාර්තා, කාර්ය මණ්ඩල වාර්තා, වත්කම් පිළිබඳ වාර්තා හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය යන සංවිධානය විසින් අප කාර්යාලය වෙත ලබාදිය යුතු සියළුම වාර්තා ලබා දී ඇති සංවිධානවල සේවය කරන විදේශිකයින් සඳහා පමණක් මාස 12ක කාලයක් සඳහා හෝ අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලබන ප්‍රමාණවත් කාලයක් සඳහා හෝ වීසා ලබාදීමට කටයුතු කරනු ලැබේ.

**04.** සංවිධානයක සේවය කරන විදේශිකයින්ගේ සේවා කාලය වසර 03ක් සම්පූර්ණ වීමෙන් පසුව, තවදුරටත් ඔවුන්ගේ සේවා අවශ්‍යතාවය පිළිබඳව සංවිධානය විසින් පැහැදිලි කිරීමෙන් අනතුරුව ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අනුමැතිය මත තවත් වසරක කාලයක් සඳහා වීසා නිර්දේශ ලබාදීමට හැකි වේ.

වීසා නිර්දේශ ලබාදීමේදී පහත සඳහන් ලේඛන ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

| අංක | ලේඛන වර්ගය | වැඩ බලපත්‍රය (Work Permit) | කෙටි කාලීන ප්‍රවේශ වීසා (Short Term Entry Visa) | ප්‍රවේශ වීසා (Entry Visa) | වාස වීසා (Residence Visa) | වැඩ බලපත්‍ර දීර්ඝ කිරීම (Extension of Work Permit) | වාස වීසා දීර්ඝ කිරීම (Extension of Residence Visa) |
|---|---|---|---|---|---|---|---|
| 01 | ඉල්ලීම් ලිපිය | √ | √ | √ | √ | √ | √ |
| 02 | අයදුම්පත් දෙකක් (වීසා /වැඩ බලපත්‍ර) | √ | - | √ | √ | √ | √ |
| 03 | විදේශ ගමන් බලපත්‍රයේ පිටපත | √ | √ | √ | √ | √ | √ |
| 04. | අවසාන වීසා පිටුවේ පිටපත | - | - | - | √ | √ | √ |
| 05 | පොලිස් නිශ්කාෂණය | √ | - | √ | - | - | - |
| 06 | ජීව දත්ත | - | - | √ | - | - | - |
| 07. | අධ්‍යාපන සහතික පිටපත් | - | - | √ | - | - | - |
| 08. | පත්වීම් ලිපිය /දීර්ඝ කිරීමේ ලිපිය/ආරාධනා ලිපිය | - | √ | √ | - | - | √ |
| 09 | විදේශ ගමන් බලපත්‍ර ප්‍රමාණයේ ඡායාරූප 3ක්. | - | - | √ | | | |
| 10. | වැඩ කාලසටහන | - | √ | √ | - | - | - |
| 11. | විවාහ සහතිකය හා උප්පැන්න සහතිකය ( යැපෙන්නන් ඇතුළුව) | - | - | √ | | | |
| 12. | ක්‍රියාකාරී සැලැස්ම / ප්‍රගති වාර්තාව ඉදිරිපත් කිරීම තහවුරු කිරීමේ ලිපිය | - | - | √ | - | √ | √ |

සැ.යු: කෙටි කාලීන ප්‍රවේශ වීසා ලබා දීම සිදු කරනු ලබන්නේ අධ්‍යාපන, සම්මන්ත්‍රණ හෝ අධීක්ෂණ හා ඇගයීම් කටයුතු සඳහා මෙරටට පැමිණෙන විදේශිකයින් සඳහාය. ඒ සඳහා ඉල්ලීම් ලිපිය, විදේශ ගමන් බලපත්‍ර පිටපත, පත්වීම් ලිපිය/ආරාධනා ලිපිය සහ වැඩ කාලසටහන ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ. මේ අනුව වීසා අයදුම් කිරීම **www.eta.gov.lk** යන වෙබ් අඩවිය හරහා මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ සිදු කිරීමට ආගමන විගමන පාලක ජනරාල් විසින් අවස්ථාව සළසා දී ඇත. ඒ අනුව වීසා අයදුම් කරන විදේශිකයින් පිළිබඳ තොරතුරු මෙම ලේකම් කාර්යාලය විසින් ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කරනු ලැබේ.

05. සංවිධානය විසින් ලබා දී ඇති ඉහත ලේඛන පරීක්ෂා කිරීමෙන් පසුව, කෙටි කාලීන ප්‍රවේශ වීසා හැර අනෙකුත් වීසා නිර්දේශ ලබා දීමට ප්‍රථම ආරක්ෂක අමාත්‍යාංශයෙන් නිශ්කාෂණ වාර්තා කැඳවීමක් සිදු කරනු ලබන අතර නිශ්කාෂණ වාර්තා ලැබෙන තෙක් වීසා නිර්දේශ නිකුත් කරනු නොලැබේ.

06. නමුත් ආරක්ෂක නිශ්කාෂණ වාර්තා ලැබෙන තෙක් වීසා අවසන් වීම හේතුවෙන් විදේශිකයා පත්වන අපහසුතාවය සැලකිල්ලට ගෙන, පෙර නිශ්කාෂණ වාර්තාව පදනම්ව ඉදිරි මාස 02කට නොවැඩි කාලයක් සඳහාත්, ආරක්ෂණ නිශ්කාෂණ වාර්තා ලැබීමෙන් පසුව, ඉතිරි කාලය සඳහාත් වීසා නිර්දේශ ලබා දෙනු ලැබේ.

සංජීව විමලගුණරත්න,
අධ්‍යක්ෂ ජනරාල් / ලේඛකාධිකාරි

පිටපත්:- 1. ලේකම්, මහජන ආරක්ෂක අමාත්‍යාංශය.
2. පාලක ජනරාල්, ආගමන විගමන දෙපාර්තමේන්තුව.
3. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිළධාරී.